# සමුපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
# கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
# Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


| මගේ අංකය / எனது இல / My No. | SP/CEC/1/O/09 | ඔබේ අංකය / உனது இல / Your No. | | දිනය / திகதி / Date | 2022.08. 03 |
|---|---|---|---|---|---|

චක්‍රලේඛ අංක 02/2022 (I)

දකුණු පළාතේ සියළුම සමුපකාරවල සභාපතිවරුන් වෙත,

<u>**දකුණු පළාතේ සියළුම සමුපකාර සමිති/සංගම් වල සේවකයින්ගේ තනතුරු, වැටුප් පරිමාණ සහ සුදුසුකම්.**</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2022.04.27 දිනැතිව නිකුත් කරනු ලැබූ 02/2022 සම්බන්ධයෙන් දකුණු පළාතේ සමුපකාර සමිති/සංගම් විසින් විවිධ ආකාරයෙන් කටයුතු කරනු ලබන බව පසුගිය කාලය තුළ නිරීක්ෂණය විය.

2. ඒ අනුව, කොමිෂන් සභාවේ උපදෙස් පරිදි, ඊට අදාළ උපදෙස් ලබා දීමට මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන අතර, චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේදී සමිති/සංගම් පහත පරිදි කටයුතු කළ යුතුය.

2.1 එම චක්‍රලේඛයේ 11 වන වගන්තිය යටතේ සුදුසු වැටුප් ක්‍රමයක් තෝරා ගැනීමේදී සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය ලබා ගැනීම අනිවාර්‍ය වන අතර, එහි පහලම වැටුප් තලය වන D වැටුප් ක්‍රමය තෝරා ගැනීමේදී ඒ සඳහා පූර්ව අනුමැතිය අවශ්‍ය නොවන අතර, වැටුප් ක්‍රමය තෝරා ගැනීම සම්බන්ධව සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

2.2 එසේම සුදුසු වැටුප් ක්‍රමයක් තෝරා ගැනීමේදී සමිතියේ/සංගමයේ සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වර්ෂයක් තුළ ගෙවනු ලබන දළ වැටුප් වල සමස්ථ එකතුව ගණනය කිරීමේදී සේවක අර්ථ සාධක අරමුදල සඳහා සමිතියේ දායකත්වය, සේවක භාරකාර අරමුදලට කරනු ලබන ගෙවීම්, දකුණු පළාත් සමුපකාර විශ්‍රාම වැටුප් සඳහා සමිතියේ දායකත්වය, සේවක පාරිතෝෂිත වෙන් කිරීම් හා සමිතියේ සේවකයින් වෙනුවෙන් වැටුප් හෝ දීමනා වෙනුවෙන් දරනු ලබන වෙනත් වියදම් ද සැලකිල්ලට ගත යුතුය.

2.3 සුදුසු වැටුප් ක්‍රමයක් තෝරා ගැනීමේදී දැනට රටෙහි පවතිව ආර්ථික අර්බුදය හමුවේ සමිතියේ/සංගමයේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට හානියක් නොවන පරිදි හා දැනට වැටුප් සඳහා සමිතිය දරන වියදම සමිතියට දැරිය හැකි මට්ටම ඉක්මවා නොයන පරිදි නව වැටුප් ක්‍රමය තෝරා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වග බලා ගත යුතුය.

2.4 මෙම කරුණ සම්බන්ධයෙන් දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් 2022.06.22 දිනැතිව අංක 01/2022 පොදු උපදෙස් නිකුත් කර ඇති අතර, සමුපකාර සමිති/සංගම් විසින් එහි උපදෙස් අනුව කටයුතු කළ යුතුය. එසේම, සේවකයින් අන්තර්ග්‍රහණය සඳහා මා වෙත ඉදිරිපත් කිරීමේදී D වැටුප් ක්‍රමයට වඩා ඉහළ වැටුප් ක්‍රමයක් තෝරා ගත් සමිති/සංගම් විසින් දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් ලිඛිත එකඟතාවය ලබා දුන් ලිපියේ සහතික කළ පිටපතක් ද මා වෙත ඉදිරිපත් කළ යුතුය.

03. 02/2022 චක්‍රලේඛය ප්‍රකාරව සෑම සමිතියක්/සංගමයක් විසින්ම සිය පිරිස්බල තක්සේරුව සංශෝධනය සඳහා කටයුතු කළ යුතුය. පිරිස්බල තක්සේරුව සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා අනුමත කිරීමෙන් අනතුරුව ඊට අනුරූපී වන පරිදි 02/2022 චක්‍රලේඛයේ උපලේඛන 06 හි සඳහන් පරිදි, එක් එක් සේවකයන් අන්තර්ග්‍රහණය කිරීමේ අයදුම්පත්‍ර මා වෙත එවීමට කටයුතු කළ යුතුය.

මෙම චක්‍රලේඛය දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ එකඟතාවය මත නිකුත් කරන ලදී.

2022.08.03

ජයන්ත ජී. ලියනගේ,
ලේකම්(වැ.බ),
සමුපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභා
දකුණු පළාත

පිටපත් :-
01. ප්‍රධාන ලේකම්, දකුණු පළාත
02. ලේකම්, කෘෂිකර්ම ගොවිජන සංවර්ධන....සමුපකාර අමාත්‍යාංශය - දකුණු පළාත
03. සමුපකාර සංවර්ධන කොමසාරිස් / රෙජිස්ට්‍රාර් - දකුණු පළාත.
04. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
05. පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
06. චක්‍රලේඛ ගොනුවට